සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I** | කාලය / காலம் / **Time**: පැය 01 |

<u>සැලකිය යුතුයි.</u>

**(i)** සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(ii)** අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

**(iii)** ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

**(iv)** එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.


(01) ආබ්‍රහම් කැඳවීම ලැබුයේ,

(1) කානාන් දේශයේ සිටින විටය. (2) හාරාන් දේශයේ සිටින විටය.
(3) ඌර්දේශයේ සිටින විටය. (4) මිසරයේ සිටින විටය.

(02) ජේසුස් වහන්සේගේ සේවය පිළිබඳ දිවැස් වැකි පැවසූ දිවැසිවරයෙකි,

(1) යෙසායා (2) මීකා (3) සෙකරියා (4) ජෙරමියා

(03)




ඉහත විශේෂ ලක්ෂණ අදාළ වනුයේ,

(1) සාම සංකල්පය ට ය. (2) විමුක්ති සංකල්පය ට ය.
(3) මෙසියානු සංකල්පය ට ය. (4) උපදේශන සංකල්පය ට ය.

(04) " දරුවා වැඩි ආත්මානුභාවයෙන් බලවත්ව තමන් ඉශ්‍රායෙල්ට ප්‍රකාශ වන දිනය දක්වා පාළුකරයෙහි සිටියේය"

ඉහත ප්‍රකාශයේ සඳහන් "දරුවා" නම්

(1) ජේසුස්වහන්සේ ය. (2) ඉග්මායෙල් ය.

(3) එලියා ය. (4) ස්නාවක ජොහාන් ය.

(05) මුළාව ගිය බැටළුවා සම්බන්ධයෙන් කිතුනු අපගේ වගකීම නම්,

(1) ඔහුට ආරක්ෂාව සැපයීමය. (2) ඔහු මනාව පෝෂණය කිරීමය.

(3) ඔහු නැවත රැළට ගෙන ඒමය. (4) ඔහුගේ තුවාල සුව කිරීමය.

(06) ඉශ්‍රායෙල්වරුන්ට පරෙවි පැටවුන් දෙදෙනෙකු හෝ කොබෙයියන් දෙදෙනකු පූජා කිරීමට නියමිත වූයේ,

(1) කැප කිරීමේ දීය. (2) චර්මච්ඡේදනයයේ දීය.

(3) බව්තීස්මයේ දීය. (4) පාස්කු මංගල්‍යයේ දීය.

(07) ජෝබ් හා ජෙරමියා යන දෙදෙනාටම පොදු ලක්ෂණය නම්,

(1) වහල්කමට ගෙනයනු ලැබීමයි. (2) ඇඳහිල්ල නිසා දුක්විඳීමට සිදුවීමයි.

(3) මිනිසුන් විසින් රවටනු ලැබීමයි. (4) දේවකැමැත්තට පිටුපෑමට සිදුවීමයි.

(08) ක්‍රිස්තොස් යන්නෙහි අර්ථය නම්,

(1) 'දෙවියන්වහන්සේ මුදන සේක' යන්නයි. (2) 'යහපත් එඬේරා' යන්නයි.

(3) 'දෙවියන්වහන්සේ ඇසූ සේක' යන්නයි. (4) 'ආලේපලත් තැනැත්තා' යන්නයි.

(09) "එසේ නම් අප කුමක් කළ යුතු ද?" යන්නට ස්නාවක ජොහාන්තුමාගේ පිළිතුර වූයේ,

(1) 'නියමිත පමණට වැඩියෙන් අය බදු නොගන්න' යන්නයි.

(2) 'ආබ්‍රහම් අපගේ පියාණෝ යැයි සිතින් කියා නොගන්න' යන්නයි.

(3) 'අඳනා දෙකක් ඇති අය නැති අයට දේවා' යන්නයි.

(4) 'ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න' යන්නයි.

(10) නාසරෙත් ප්‍රකාශයට අදාළ නොවන කරුණ වන්නේ,

(1) සැමදෙනාටම ස්වාමින්වහන්සේගෙන් සෞභාග්‍ය ලැබෙන බව පැවසීමයි.

(2) පීඩිත වූවන් මුදවාලීමයි.

(3) දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීමයි.

(4) අන්ධයන්ට පෙනීම ලැබෙන බව දැන්වීමයි.

(11) 'ප්‍රේමය' සම්පිණ්ඩනය කරමින් ජේසුස්වහන්සේ ඉදිරිපත් කළ කොටස් දෙකකි.

(1) තමාට ප්‍රේම කිරීම හා දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම.

(2) දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම හා තම අසල්වැසියාට ප්‍රේම කිරීම.

(3) තම අසල්වැසියාට ප්‍රේම කිරීම හා දේව රාජ්‍යයට ප්‍රේම කිරීමයි.

(4) දේව රාජ්‍යයට ප්‍රේම කිරීම හා තමාට ප්‍රේම කිරීමයි.

(12) පහත කාර්යයන් අතුරෙන් ජේසුස් වහන්සේගේ ධර්මදූතයන් සැත්තෑදෙනාට පමණක් පැවරූ කාර්යයක් වනුයේ,

(1) රෝගීන් සුව කිරීමයි. (2) සේවකයන් ඉල්ලා යාච්ඤා කිරීමයි.

(3) දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමයි. (4) ආගමික නායකයන් ගැන යාච්ඤා කිරීමයි.

(13) ජේසුස්වහන්සේගේ නව පවුල් සංකල්පයට අයත් වනුයේ,

(1) සිය පවුල් සෑම දෙනාය. (2) ශ්‍රාවකයන් දොළොස් දෙනාය.

(3) දේව වචනය අසා පිළිපදින සෑම දෙනාය. (4) මුළු මිනිස් සංහතියයි.

(14) යුක්තිය උදෙසා පීඩා විඳින්නන්ගේ වරප්‍රසාදය නම්,

(1) දේව පුත්‍රභාවය ලැබීමයි. (2) පොළොවේ උරුමය ලැබීමයි.

(3) ස්වර්ග රාජ්‍ය උරුම කර ගැනීමයි. (4) සැනසීම ලැබීමයි.

(15) සම්පූර්ණ සාමය සඳහා යෙදෙන ග්‍රීක් වදන නම්,

(1) 'අයිරේනියා' ය. (2) 'රුවාක්' ය. (3) 'ශාලොම්' ය. (4) 'එප්‍රාතා' ය.

(16) පහත සුව කිරීම් අතුරෙන් සමාජ තහංචි නොතකා ජේසුස්වහන්සේ විසින් සිදුකළ සුවකිරීම,

(1) අන්ධ මිනිසා සුව කිරීමයි. (2) ලාදුරු රෝගියා සුව කිරීමයි.

(3) අංශභාග රෝගියා සුව කිරීමයි. (4) මීමැස් මොර රෝගී දරුවා සුව කිරීමයි.

(17) කිතුනු ගුණාංග අතුරෙන් කොන්දේසියක් සහිත එකම ගුණාංගය නම්,

(1) දයාවයි. (2) සාමයයි. (3)කරුණාවයි (4) කමාවයි

(18) ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් අනුව දේවරාජ්‍යයට ප්‍රවිශිෂ්ඨවීම නම්,

(1) වැදගත් සේවාවන්වල යෙදිය යුතුය.

(2) සිය යුතුකම් හා වගකීම් මනාව ඉටුකළ යුතුය.

(3) ළදරුවකු සේ නිහතමානී විය යුතුය.

(4) ආගමික පිළිවෙත් නිසි පරිදි ආරක්ෂා කළ යුතුය.

(19) ක්‍රිස්තුවහන්සේ හා අප අතර ඇති ඒකත්වයේ ආදර්ශය සමාජය තුළ පළඳුවීමට හේතුවකි,

(1) අප අන්‍ය ආගම්වල අයට සහායවීම. (2) අප නිකාය වශයෙන් බෙදී සිටීම.

(3) අප අඩු අධ්‍යාපනයක් ලැබීම. (4) අප දරිද්‍රතාවයට පත් වීම.

(20) පරිසිවරුන් විසින් ජේසුස්වහන්සේට ඉදිරිපත් කරන ලද ප්‍රශ්න නම්,

(1) පුනරුජ්ජීවන ප්‍රශ්නය හා උපවාස ප්‍රශ්නයයි.

(2) සබත කඩ කිරීමේ ප්‍රශ්නය හා අධිකාරී බලය පිළිබඳ ප්‍රශ්නයයි.

(3) උපවාස ප්‍රශ්නය හා සබත කඩකිරීම පිළිබඳ ප්‍රශ්නයයි.

. (4) අධිකාරී බලය පිළිබඳ ප්‍රශ්නය හා පුනරුජ්ජීවනය ප්‍රශ්නයයි.

(21) සදාතන ජීවනය සඳහා අප ගෙන යන මූලික සිද්ධාන්ත කිහිපයක් පහත දැක්වේ,

A - ශුද්ධකම B - ධනවත් කම C - ධර්මිෂ්ඨකම

D - මෘදුකම E - පරිපූර්ණ ප්‍රීතිය

ඒ අතුරින් නිවරදි වනුයේ,

(1) A,B හා C ය. (2) A,C හා E ය. (3) B,D හා E ය. (4) C,D හා E ය.

(22) ලිඛිත ව්‍යවස්ථාව පමණක් පිළිගත් ජුදා ආගමික කණ්ඩායම වූයේ,

(1) සද්දුසිවරුය. (2) විනයධරන්ය. (3) පරිසිවරුන්ය (4) එසේනිවරුන්ය.

(23) ජේසුස්වහන්සේගේ රාජතේජසින් ජෙරුසලමට පිවිසෙන බව කලින් ප්‍රකාශ කළ දිවැසිවරයා,

(1) මීකාය. (2) නාහුම්ය. (3) සෙකරියාය.. (4) මලාකිය.

(24) ජුදෙව් කෘෂිකාර්මික මංගල්‍යයකි,

(1) කූඩාරම් මංගල්‍යය (2) සති මංගල්‍යය

(3) පාස්කු මංගල්‍යය (4) පෙන්තකොස්ත මංගල්‍යය.

(25) 'පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න' යැයි ජේසුස් වහන්සේ පැවසූයේ,

(1) කුරුසයේදී ය. (2) ගෙත්සෙමෙන උයනේදී ය.

(3) ජෙරුසලමේ දේව මාළිගයේදී ය. (4) පිලාත් ළඟට ගෙන ගිය විටය.

(26) මුල් කිතුනු සභාව ශුද්ධාත්ම බලයෙන් ගැටළු නිරාකරණය කර ගත හැකි බවට නිදසුනකි.

(1) ගෙයින් ගෙට ගොස් යාච්ඤා කිරීම

(2) ඉතියෝපීය මිනිසා හට දේව වචනය පහදා දීම.

(3) සහනාධාර බෙදීම සඳහා උපස්ථායකයක් පත් කිරිම.

(4) සියල්ල පොදුවේ තබාගැනීම.

(27) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝද්දයි ඇසූ ප්‍රශ්නයට ජේසුස්වහන්සේගේ පිළිතුර වූයේ,

(1) ' මා එසේ බැව් පවසන්නේ ඔබය' කියාය.

(2) ' මම එය ඔබට නොකියමි' කියාය..

(3) නිශ්ශබ්දව සිටීමය.

(4) ඔබට එය කුමකටද? කියා ප්‍රති ප්‍රශ්නයක් ඇසීමය.

(28) පහත සඳහන් අය අතුරින් කුරුසිය දරමින් දේව රාජ්‍යයේ මෙහෙවරට දායක වීමට අපට මඟපෙන්වන්නේ,

(1) සමාරියේ ස්ත්‍රීයය. (2) නිකදේමුස්ය.

(3) අරිමාතියේ ජෝසෙප්ය (4) සිරේනියේ සීමොන්ය.

(29) ශුද්ධාත්ම ආගමනය පිළිබඳ අනාවැකි ඉදිරිපත් කළ දිවැසිවරයෙකි,

(1) ජෝවෙල් (2) හොෂියා (3) ජෙරමියා (4) ඔබදියා

(30) පහත සඳහන් වනුයේ පේදුරුතුමා දුටු දර්ශනය මගින් උගත හැකි පාඩම් කීපයකි.

A - මිනිස් නීතිය ස්ථාපිත කිරිමට යුහුසුළු විය යුතුය.

B - දේවහඬට ක්ෂණික ප්‍රතිචාර දැක්විය යුතුය.

C - අපවිත්‍ර දෙයින් ඈත්ව සිටිය යුතුය.

D - කිසිවකුගේ තරාතිරම් නොබැලිය යුතුය.

ඒ අතුරින් නිවැරදි වනුයේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

(31) පාවුළුතුමාට අනුව ප්‍රේමය සිය ජීවිතය තුළ ස්ථාපිත කරගැනීම සඳහා වඩාත් අවශ්‍ය වනුයේ,

(1) දන්දීම හා දයාවයි. (2) යාච්ඤාව හා ඇදහිල්ලයි.

(3) දයාව හා ඇදහිල්ලයි. (4) දන්දීම හා යාච්ඤාවයි.

(32) ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් අනුව යමකු අප කැඳවනු ලැබූ කළ අප ගොස් අසුන්ගත යුත්තේ,

(1) ඉහළම ස්ථානයනය. (2) මිතුරන් අසලින්ය.

(3) කැඳවූවන්ට ආසන්නවය. . (4) පහත්ම ස්ථානයේය.

(33) දේවරාජ්‍යයේ මවිතකර වර්ධනය දැක්වීම සඳහා ජේසුස්වහන්සේ ඉදිරිපත් කළ උපමාවක් වනුයේ,

(1) කිරිඳි පිළිබඳ උපමාවය. (2) මුහුන් පිළිබඳ උපමාවය.

(3) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවය. (4) රන්කාසි දසය පිළිබඳ උපමාය.

(34) තාර්සස් නගරයේ උපත ලැබීමෙන් පාවුළු සිය සේවය සඳහා ලද වටිනාම කරුන නම්,

(1) විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යොමුවීමට හැකිවීමයි.

(2) ජුදෙව් ආගමික වත්පිළිවෙත් ඉගෙනීමට අවකාශ ලැබීමයි.

(3) විවිධ ජාතීන් ඇසුරු කිරීමට හා ඔවුන් පිළිබඳ හසල දැනුමක් ඇතිකර ගත හැකිවීමයි.

(4) ග්‍රීක් නාමයකට උරුමකම් කීමට හැකිවීමයි.

(35) ජේසුස්වහන්සේ වර්ගවාදය අබිබවා මිනිසාට ප්‍රේම කරන බව පෙන්නුම් කරන සිදු වීම නම්,

(1) නිකදේමුස් සමග සංවාදයයි. (2) සමාරීය ස්ත්‍රීය සමග සංවාදයයි.

(3) පව්කාර ස්ත්‍රීය සමග සංවාදයයි. (4) සාකෙවුස් සමඟ සංවාදයයි.

(36) පාවුළුතුමා දක්වන පරිදි කිතුනු පවුලක තිබිය යුතු වැදගත්ම ගුණාංග වනුයේ,

(1) ප්‍රේමය හා සමානාත්මතාවයි.
(2) ගෞරවය හා ආර්ථික ශක්තියයි.
(3) කීකරුකම හා දයාවයි.
(4) අචාරශීලිත්වය හා ප්‍රඥාවයි.

(37) සතුරන් කෙරෙහි මෙත්සිත් වැඩීමේදී ජේසුස් වහන්සේගේ ඉගැන්වීම ඇසුරෙන් වඩාත් වැදගත් වනයේ,

(1) අත්තිවාරම් දෙකය.
(2) භාග්‍ය පිළිබඳ ඉගැන්වීමය.
(3) සග සම්පත් පිළිබඳ ඉගැන්වීමය.
(4) රන් අණය.

(38) පාවුළුතුමාට එපිකූරිය හා ස්තෝයික දාර්ශනිකයන් හමුවූයේ,

(1) ඇතනස්හිදී ය.
(2) කොරින්තියේදී ය.
(3) පිලිප්පයේදී ය.
(4) එපීසයේදී ය.

(39) සැබෑ බුද්ධිමය නමස්කාරය නම්,

(1) නිහඬව සියලු දෙනාට සවන්දීමය.
(2) ශරීර දෙවිඳුන්ට කැපකළ ප්‍රසන්න ජීවමාන යාග බවට පත් කිරීමය.
(3) විනෝදකාමී ජීවිත රටාවෙන් ඈත්ව දිවි ගෙවීමය.
(4) මානව හිතවාදීව ක්‍රියාකරමින් සියලු ආඥා රක්ෂා කිරීමය.

(40) ජීවිත ගමනේදී විවිධ දුෂ්කරතාවලට මුහුණදෙන විටදී කිතුවන්,

(1) තම ශාරීරික පෝෂණය සඳහා වඩාත් උනන්දු විය යුතුය.
(2) බාහිර ආටෝපයෙන් වැළකී දිවි ගෙවිය යුතුය.
(3) ශුද්ධාතම මඟපෙන්වීම තුළ දේව කැමැත්තට යටත් විය යුතුය.
(4) අභියෝග එල්ල කරන්නන්ට එරෙහිව නැගී සිටිය යුතුය.